සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2019
# ගණිතය

**6 ශ්‍රේණිය** **කාලය පැය 2 යි**


නම/ විභාග අංකයඃ

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- I කොටස සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලැබේ.

01. සුළු කරන්න. $\frac{2}{7} + \frac{3}{7}$

02. සරල රේඛීය සංවෘත තල රූප තෝරා යටින් ඉරි අඳින්න.



03. $<$, $>$ හෝ $=$ යන සංකේත වලින් සුදුසු සංකේතය හිස්තැනට යොදන්න.

$\frac{5}{9}$ ......... $\frac{2}{9}$


04. 1, 3, 6, 10, ......... ත්‍රිකෝණ සංඛ්‍යා රටාවේ ඊළඟ ත්‍රිකෝණ සංඛ්‍යාව ලියන්න.

05. හිස්කොටු වලට අදාල සංඛ්‍යා ලියන්න.

$$\frac{2}{7} = \frac{2 \times 3}{7 \times \square} = \frac{6}{\square}$$

06. ප.ව. 2.45 යන වේලාව අන්තර් ජාතික සම්මත ක්‍රමයට ලියන්න.

07. රවුම තුළදී ඇති සමූහ පොදු ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන් කර රවුම් තුළ ලියන්න.





08. හිස්තැන් සම්පූර්ණ කරන්න.

794cm = ...................m ...................cm


09. සුළු කරන්න.

3.85 + 12.7

10. මෙම රූපය හඳුන්වන නම කුමක් ද?



11. ගණක රාමුවේ දක්වා ඇති සංඛ්‍යාව ලියන්න.




12. $\frac{4}{7} - \frac{5}{14}$ හි අගය සොයන්න.

13. 2 න් බෙදෙන පූර්ණ සංඛ්‍යා වල ඒකස්ථානය සඳහා තිබිය හැකි ඉලක්කම් සියල්ල ලියන්න.

14. පහත දැක්වෙන සංඛ්‍යාව වචනයෙන් ලියන්න.


12.31

15. සුවිනි ළඟ රු. 500.00 ක් ඇත. ඇය රු. 375.00 ක් වූ පොතක් හා රු. 20.00, පෑන් 3 ක් මිලට ගත්තේ නම් ඉතිරිවන මුදල සොයන්න.

16. පහත දී ඇති සංඛ්‍යා අවරෝහණ පටිපාටියට ලියන්න.

2, 1.1, 0.4, 0.2, 0.7

17. ඉහත රටාවට අනුව පස්වන සමචතුරස්‍ර සංඛ්‍යාව ලියන්න.



18. පහත සඳහන් සංඛ්‍යාව සම්මත ආකාරයට ලියා එය කියවන ආකාරයද ලියන්න.

37489018

19. 40 ත් 80 ත් අතර 7 හි ගුණාකාර ලියන්න.

20. ඝනකයක

(i) මුහුණතක හැඩය කුමක් ද?


(ii) මුහුණත් සංඛ්‍යාව කීයද?

## II කොටස

- **පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද ලැබේ.**

01. පහත දැක්වෙන සංඛ්‍යා කාඩ්පත් ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 7 | 8 | 9 | 10 | 11 | 12 |
| 13 | 14 | 15 | 16 | 17 | 18 |
| 19 | 20 | 21 | 22 | 23 | 24 |
| 25 | 26 | 27 | 28 | 29 | 30 |





(i) මෙම සංඛ්‍යා ගස ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන එක් එක් රවුම තුළට සුදුසු සංඛ්‍යා 5 බැගින් ලියන්න. (ල.02)


(ii) මෙම කාඩ්පතෙහි ඇති විශාලම ත්‍රිකෝණ සංඛ්‍යාව තිත් රටාවකින් නිරූපණය කරන්න. (ල.02)

(iii) ඉරට්ටේ සංඛ්‍යාවක් ද සංයුක්ත සංඛ්‍යාවක් ද ත්‍රිකෝණ සංඛ්‍යාවක් ද වන කුඩාම සංඛ්‍යාව ලියන්න. (ල.02)

02. ඝනවස්තු නිර්මාණය සඳහා සකස් කළ පතරොම් 02 ක් පහත දැක්වේ.



A



B

(i) A හා B පතරොම භාවිතා කර සාදන ලද ඝනවස්තු 02 නම් කර පිළිවෙල ලියන්න. (ල.02)

(ii) B ඝනවස්තුවේ මුහුණතක හැඩය හඳුන්වන සුවිශේෂ නම ලියන්න. (ල.01)

(iii) A පතරොම භාවිතයෙන් සාදන ලද ඝනවස්තුවේ දාර, ශීර්ෂ හා මුහුණත් ගණන පිළිවෙලින් ලියන්න. (ල.03)

(iv) ඔබ සැදූ වෙනත් ඝනවස්තුවක නම ලියා එම ඝනවස්තුව වැනි පරිසරයේ දක්නට ලැබෙන ඝනවස්තු දෙකක නම් ලියන්න. (ල.03)

(v) B පතරොමෙන් සැදූ ඝනවස්තුව සැදීම සඳහා වෙනත් පතරොමක් අඳින්න. (ල.02)

03. (i) $>$, $<$ හෝ $=$ සංකේත යොදා හිස්තැන් පුරවන්න. (ල.02)

(a) $\frac{5}{11}$ ......... $\frac{4}{11}$ (b) $\frac{3}{5}$ ......... $\frac{6}{10}$

(ii) පහත සඳහන් භාග ආරෝහණ පිළිවෙලට ලියන්න. (ල.02)


$\frac{2}{3}$ , $\frac{2}{6}$ , $\frac{2}{10}$ , $\frac{2}{5}$

(iii) ඒකක භාග දෙකක් ලියන්න. (ල.02)

(iv) සුළු කරන්න.

(a) $\frac{3}{4} + \frac{1}{12}$ (ල.02) (b) $\frac{4}{7} + \frac{1}{7}$ (ල.01) (c) $\frac{11}{15} - \frac{3}{5}$ (ල.02)

04. (i) රූපයේ අඳුරු කර ඇති කොටස භාගයක් ලෙස ලියන්න. (ල.01)



(ii) එය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. (ල.01)

(iii) ඉහත (ii) හි සංඛ්‍යාව වචනයෙන් ලියන්න. (ල.01)

(iv) සුළු කරන්න. (ල.04)

(a)
$$\begin{array}{r} 25.73 \\ -\ 13.67 \\ \hline \hline \end{array}$$

(b) 5.32 + 2.7

(v) තාත්තා ළඟ තිබූ මුදලකින් $\frac{1}{3}, \frac{1}{4}, \frac{1}{12}$ ක් යන ප්‍රමාණයන් දරුවන් තිදෙනකු අතර බෙදා දුනි.

(a) දරුවන් තිදෙනාට ලබා දුන් මුළු ප්‍රමාණය භාගයක් ලෙස දක්වන්න. (ල.02)

(b) තාත්තා ළඟ තිබූ මුදලින් ඉතිරි වූ කොටස කොපමණද? (ල.02)

05. (a) (i) සෘජු කෝණාස්‍රයක් ඇඳ එහි පළල 8cm ලෙස ලකුණු කරන්න. (ල.02)


(ii) එහි දිග පළල මෙන් දෙගුණයක් නම්,

(a) එහි දිග කීයද?

(b) එය රූපයේ ලකුණු කරන්න. (ල.02)

(iii) එම සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සොයන්න. (ල. 03)

(b)




(A) (B)

(i) A හා B තලරූප හඳුන්වන නම් ලියන්න. (ල.02)

(ii) A තල රූපයේ විශේෂ ලක්ෂණයක් ලියන්න. (ල.01)

(iii) B තල රූපයේ විශේෂ ලක්ෂණයක් ලියන්න. (ල.01)

06. දී ඇති කාඩ්පත් වල සංඛ්‍යා අතුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 16 | 20 | 18 | 10 | 8 | 45 | 15 | 70 |

(i) 3 හි ගුණාකාර දෙකක් ලියන්න. (ල.02)

(ii) 5 හි ගුණාකාර සියල්ල ලියා ඒ අතුරින් විශාලම 5 හි ගුණාකාරය ලියන්න. (ල.03)


(iii) 5 සහ 10 යන සංඛ්‍යා දෙකෙහිම ගුණාකාරවන සංඛ්‍යා 3 ක් ලියන්න. (ල.03)

(iv) 12 හි සාධක සියල්ල ලියන්න. (ල.03)

07. (a) සමචතුරස්‍රය, ඝනකය, ඝනකාභය, ත්‍රිකෝණය, සමාන්තරාස්‍රය, රොම්බසය, චතුරස්‍රය, චතුස්තලය, ඍජුකෝණාස්‍රය, ත්‍රිපිසියම, සිලින්ඩරය

(i) ඉහත ඒව පොදු ලක්ෂණයක් අනුව කාණ්ඩ 02 කට වෙන්කර දක්වා එම කාණ්ඩ සඳහා සුදුසු නම් ඒ එක එකක් ඉදිරියෙන් ලියන්න. (ල.06)

(b) A, B, C යනු භාජන 3 කට පුරවා ඇති ජල ප්‍රමාණය රූපයේ දැක්වේ.




A B C

(i) A භාජනයේ තිබෙන ජල ප්‍රමාණය මිලිලීටර් වලින් දක්වන්න. (ල.01)

(ii) A හා C භාජන දෙකේ ඇති මුළු ජල ප්‍රමාණය ලීටර් හා මිලිලීටර් වලින් දක්වන්න. (ල.01)

(iii) A භාජනයේ ඇති ජල ප්‍රමාණය B භාජනයේ ඇති ජල ප්‍රමාණයට වඩා කොපමණ වැඩි ද? (ල.03)